# සහජාත මහා ගණය

## 1. සහජාත

### 1. කුසලො කුසලස්ස -

**කුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍ය වන්නා වූ කුසල් සිත් එක්විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**කුසලස්ස ධම්මස්ස** යන සම්ප්‍රදන පාඨයෙන් කුසල් සිත් එක් විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**සහජාතපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති සය අතුරෙන් සහජාත සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර, අඤ්ඤමඤ්ඤ, සම්පයුත්ත, යනුවෙන් මුළු ගණන සයකි)

### 2. කුසලො අබ්‍යාකතස්ස

**කුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන්නා වූ පඤ්චවෝකාර භවයෙහි උපදනා අවස්ථාවේ දී කුසල සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධ ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදන පාඨයෙන් කුසල සිත් විසින් උපදවන චිත්තජ රූප යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**සහජාතපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති පස අතුරෙන් සහජාත සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර, විප්පයුත්ත යනුවෙන් මුළු ගණන පසකි.)

### 3. කුසලො කුසලාබ්‍යාකතස්ස

**කුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ඔවුනොවුන් නාමස්කන්ධයන්ට ද, චිත්තජ රූපයන්ට ද ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භවයෙහි උපදනා අවස්ථාවේ දී කුසල සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**කුසලාබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් කුසල් සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ද කුසල සිත් විසින් උපදවන චිත්තජ රූපයෝ ද යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**සහජාතපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන සහජාත නිස්සය අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති සතරෙන් සහජාත සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර)

### 4. අකුසලො අකුසලස්ස

**අකුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන්නා වූ අකුසල සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අකුසලස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් අකුසල සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

*අකුසල පද තුනෙහි කරණය කුසල පද තුන හා සමාන ය.

### 5. අකුසලො අබ්‍යාකතස්ස

**අකුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන්නා වූ පඤ්චවෝකාර භවයෙහි උපදනා අවස්ථාවේ දී අකුසල සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධ ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් අකුසල සිත් විසින් උපදවන චිත්තජරූප යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**6. අකුසලො අකුසලාබ්‍යාකතස්ස**

**අකුසලො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ඔවුනොවුන් නාමස්කන්ධයන්ට ද, චිත්තජ රූපයන්ට ද ප්‍රත්‍ය වන්නා වූ පඤ්චවෝකාර භවයෙහි උපදනා අවස්ථාවේ දී අකුසල සිත් දෙළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අකුසලාබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් අකුසල සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ද අකුසල සිත් විසින් උපදවන චිත්තජ රූපයෝ ද යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**7. අබ්‍යාකතො අබ්‍යාකතස්ස**

**<u>ප්‍රවෘත්ති</u> - අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ඔවුනොවුන්ට ද; ඔවුනොවුන් නාමස්කන්ධයන්ට ද, චිත්තජ රූපයන්ට ද ප්‍රත්‍යය වන්නා වූ විපාක සිත් සතිස ය ක්‍රියා සිත් විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් විපාක සිත් සතිස ය ක්‍රියා සිත් විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ද විපාක ක්‍රියා සිත් විසින් උපදවන චිත්තජ රූපයෝ ද යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**සහජාතපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත විප්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති අට අතුරෙන් සහජාත සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර, මධ්‍යම සතර යනුවෙන් මුළු ගණන අටකි.)

**<u>ප්‍රතිසන්ධි</u> - අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ඔවුනොවුන්ට ද; ඔවුනොවුන් නාමස්කන්ධයන්ට ද,

කර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන්නා වූ ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද, අවයව හා සමූහ වූ නාමස්කන්ධයෝ ද, හදය වස්තුව ද යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද, අවයව හා සමූහ වූ නාමස්කන්ධයෝ ද, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ද යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**සහජාතපච්චයෙන** යන කරණ පාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත විප්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති අට අතුරෙන් සහජාත සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර, මධ්‍යම සතර මුළු ගණන අටකි.)

<u>ශුද්ධරූප වාරයෙහි</u> **- අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ඔවුනොවුන්ට ද; උපාදරූපයන්ට ද ප්‍රත්‍යය වන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ බාහිර ආහාරජ උතුජ අසඤ්ඤසත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ වශයෙන් සතර මහාභූත ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් මහාභූත සහිත චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ බාහිර ආහාරජ උතුජ අසඤ්ඤසත්ව කර්මජ ප්‍රවෘත්තිකර්මජ උපාදරූප යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**සහජාතපච්චයෙන** යන කරණ පාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති පසෙන් සහජාත සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර, අඤ්ඤමඤ්ඤ යැයි මුළු ගණන පසකි.)

**8. කුසලාබ්‍යාකතො අබ්‍යාකතස්ස**

**කුසලාබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන්නා වූ පඤ්චවෝකාර භවයෙහි උපදනා අවස්ථාවේ දී කුසල සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය;

අවයව වූ ද සමූහ වූ ද මහාභූතයෝ යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදන පාඨයෙන් කුසල සිත් විසින් උපදවන චිත්තජ රූප ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**සහජාතපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන සහජාත නිස්සය අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති සතර අතුරෙන් සහජාත සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර)

**9. අකුසලාබ්‍යකතො අබ්‍යාකතස්ස**

**අකුසලාබ්‍යකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භවයෙහි උපදනා අවස්ථාවේ දී අකුසල සිත් දෙළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය; අවයව වූ ද සමූහ වූ ද මහාභූතයෝ යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදන පාඨයෙන් අකුසල සිත් විසින් උපදවන චිත්තජ රූප ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**සහජාතපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන සහජාත නිස්සය අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති සතර අතුරෙන් සහජාත සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර)

## සහජාත මධ්‍යම ගණය

# 1. අඤ්ඤමඤ්ඤ

1.කුසලො කුසලස්ස 2. අකුසලො අකුසලස්ස යන සඞ්ඛ්‍යා දෙක සහජාත ප්‍රත්‍යය හා සමග සමාන ය.

**3. අබ්‍යාකතො අබ්‍යාකතස්ස**

**<u>ප්‍රවෘත්ති</u> - අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන්නා වූ විපාක සිත් සතිස ය ක්‍රියා සිත් විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් විපාක සිත් සතිස ය ක්‍රියා සිත් විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**අඤ්ඤමඤ්ඤපච්චයෙන** යන කරණ පාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන අඤ්ඤමඤ්ඤ සහජාත නිස්සය විපාක සම්පයුත්ත අත්ථි අවිගත ප්‍රත්‍ය යන ශක්ති සත අතුරෙන් අඤ්ඤමඤ්ඤ සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර, අඤ්ඤමඤ්ඤ, සම්පයුත්ත, විපාක යනුවෙන් මුළු ගණන සතකි.)

**<u>ප්‍රතිසන්ධි</u> - අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් නාමස්කන්ධයන්ට ද, හදය වස්තුවට ද ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද, අවයව හා සමූහ වූ නාමස්කන්ධයෝ ද, හදය වස්තුව ද යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද, අවයව හා සමූහ වූ නාමස්කන්ධයෝ ද, හදය වස්තුව ද යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**අඤ්ඤමඤ්ඤපච්චයෙන** යන කරණ පාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන අඤ්ඤමඤ්ඤ සහජාත නිස්සය විපාක සම්පයුත්ත විප්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති අට අතුරෙන් අඤ්ඤමඤ්ඤ සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර, මධ්‍යම සතර යනුවෙන් මුළු ගණන අටකි.)

**<u>ශුද්ධරූප වාරයෙහි</u> - අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන්නා වූ චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ බාහිර ආහාරජ උතුජ අසඤ්ඤසත්වකර්මජ

ප්‍රවෘත්තිකර්මජ වශයෙන් සතර මහාභූත ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ බාහිර ආහාරජ ඍතුජ අසඤ්ඤසත්ව කර්මජ ප්‍රවෘත්තිකර්මජ වශයෙන් සතර මහාභූත ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**අඤ්ඤමඤ්ඤපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන අඤ්ඤමඤ්ඤ සහජාත නිස්සය අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති පස අතුරෙන් අඤ්ඤමඤ්ඤ සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර, අඤ්ඤමඤ්ඤ යැයි මුළු ගණන පසකි.)

# 2. විපාක

**අබ්‍යාකතො අබ්‍යාකතස්ස**

**<u>ප්‍රවෘත්ති</u> - අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ඔවුනොවුන්ට ද; ඔවුනොවුන්ට නාමස්කන්ධයන්ට ද චිත්තජ රූපයන්ට ද ප්‍රත්‍යය වන විපාක සිත් සතිස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් විපාක සිත් සතිස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ද විපාක සිත් විසින් උපදවන චිත්තජ රූපයෝ ද යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**විපාකපච්චයෙන** යන කරණ පාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන විපාක සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත විප්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති අට අතුරෙන් විපාක සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර, මධ්‍යම සතර යනුවෙන් මුළු ගණන අටකි.)

**<u>ප්‍රතිසන්ධි</u> - අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ඔවුනොවුන්ට ද; ඔවුනොවුන් නාමස්කන්ධයන්ට ද, කර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස

ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද, අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයෝ යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදන පාඨයෙන් ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධයෝ ද, කර්මජ රූපයෝ ද යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**විපාකපච්චයෙන** යන කරණ පාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන විපාක සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත විප්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති අට අතුරෙන් විපාක සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර, මධ්‍යම සතර යනුවෙන් මුළු ගණන අටකි.)

# 3. සම්පයුත්ත

1.කුසලො කුසලස්ස 2. අකුසලො අකුසලස්ස යන සඞ්ඛ්‍යා දෙක සහජාත ප්‍රත්‍යය හා සමඟ සමාන ය.

**3. අබ්‍යාකතො අබ්‍යාකතස්ස**

**<u>ප්‍රවෘත්ති</u> - අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන්නා වූ විපාක සිත් සතිස ය ක්‍රියා සිත් විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදන පාඨයෙන් විපාක සිත් සතිස ය ක්‍රියා සිත් විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**සම්පයුත්තපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන සම්පයුත්ත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති සත අතුරෙන් සම්පයුත්ත සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර, අඤ්ඤමඤ්ඤ, සම්පයුත්ත, විපාක යනුවෙන් මුළු ගණන සතකි.)

**<u>ප්‍රතිසන්ධි</u> - අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන්නා වූ ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදන පාඨයෙන් ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**සම්පයුත්තපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන සම්පයුත්ත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති සතෙන් සම්පයුත්ත සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර, අඤ්ඤමඤ්ඤ, සම්පයුත්ත, විපාක යනුවෙන් මුළු ගණන සතකි.)

# 4. සහජාත විප්පයුත්ත

1.කුසලො අබ්‍යාකතස්ස 2. අකුසලො අබ්‍යාකතස්ස යන සඞ්ඛ්‍යා දෙක සහජාත ප්‍රත්‍යය හා සමඟ සමාන ය.

**3. අබ්‍යාකතො අබ්‍යාකතස්ස**

**<u>ප්‍රවෘත්ති</u> - අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භවයෙහි උපදනා අවස්ථාවේ දී අරූප විපාක සතර, ද්විපඤ්ච විඤ්ඤාණ දසය, රහතන් වහන්සේගේ චුති සිත හැර විපාක සිත් දෙවිස්ස ය ක්‍රියා සිත් විස්ස ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධ ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදන පාඨයෙන් විපාක සහ ක්‍රියා සිත් විසින් උපදවන චිත්තජ රූප යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**විප්පයුත්තපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන විප්පයුත්ත සහජාත නිස්සය විපාක අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති සය අතුරෙන් විප්පයුත්ත සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර, විපාක, විප්පයුත්ත යනුවෙන් මුළු ගණන සයකි.)

**<u>ප්‍රතිසන්ධි</u> - අබ්‍යාකතො ධම්මො** යන කර්තෘ පාඨයෙන් කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් පසළොස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ද; ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ හා හදය වස්තුව යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්.

**අබ්‍යාකතස්ස ධම්මස්ස** යන සම්ප්‍රදාන පාඨයෙන් පඤ්චවෝකාර ප්‍රතිසන්ධි සිත් පසළොස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධ හා කර්මජ රූප යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

**විප්පයුත්තපච්චයෙන** යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන විප්පයුත්ත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගත යන ප්‍රත්‍ය ශක්ති සත අතුරෙන් විප්පයුත්ත සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. (සහජාත මහා සතර, අඤ්ඤමඤ්ඤ, විප්පයුත්ත, විපාක යනුවෙන් මුළු ගණන සතකි.)